මාධ්‍ය නිවේදනය
සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477423 +94 11 2346257
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

| | |
|---|---|
| නිකුත් කළේ | ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව |
| දිනය | 2022 ජනවාරි 25 |

# විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වය - 2021 නොවැම්බර්

## සමස්ත නිරීක්ෂණ

2021 වසරේ නොවැම්බර් මාසයේ අපනයන ඉපැයීම් ඉතිහාසයේ ඉහළම මාසික අපනයන අගය වාර්තා කළ අතර, අඛණ්ඩව හයවන මාසයටත් එ.ජ. ඩොලර් බිලියනය ඉක්මවිය. මේ අතර, 2021 වසරේ නොවැම්බර් මාසයේ දී ආනයන වියදම ද වැඩි අගයකින් ඉහළ ගියේය. අපනයන ඉහළ යෑමේ හිතකර බලපෑම පිළිබිඹු කරමින් වෙළඳ භාණ්ඩ හිඟය, 2020 වසරේ නොවැම්බර් මාසයේ පැවති එ.ජ. ඩොලර් මිලියන 600ට සාපේක්ෂව 2021 වසරේ නොවැම්බර් මාසයේ දී එ.ජ. ඩොලර් මිලියන 553ක් දක්වා අඩු විය. සංචාරක පැමිණීම් ඉහළ යෑමේ පැහැදිලි සලකුණු පෙන්නුම් කරමින්, පසුගිය මාසයට සාපේක්ෂව කැපී පෙනෙන වර්ධනයක් සමඟින් සංචාරක පැමිණීම් අඛණ්ඩව ඉහළ ගියේය. 2021 වසරේ නොවැම්බර් මාසයේ දී විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණවල අඩු වීමක් තවදුරටත් පෙන්නුම් කළේය. මාසය තුළ අන්තර් බැංකු වෙළඳපොළේ බර තැබූ සාමාන්‍ය එතැන් විනිමය අනුපාතිකය එ.ජ. ඩොලරයට රුපියල් 202ක පමණ මට්ටමක පැවතුණි.

**සංඛ්‍යා සටහන 1: විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වයෙහි සාරාංශය (අ)**

| කාණ්ඩය | 2020 නොවැම්බර් එ.ජ.ඩො. මිලියන | 2021 නොවැම්බර් එ.ජ.ඩො. මිලියන | වෙනස (%) | 2020 ජන. - නොවැ. එ.ජ.ඩො. මිලියන | 2021 ජන. - නොවැ. එ.ජ.ඩො. මිලියන | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| වෙළඳ භාණ්ඩ අපනයන | 784 | 1,211 | 54.6 | 9,083 | 11,345 | 24.9 |
| වෙළඳ භාණ්ඩ ආනයන | 1,384 | 1,765 | 27.5 | 14,529 | 18,396 | 26.6 |
| වෙළඳ ශේෂය | -600 | -553 | | -5,446 | -7,051 | |
| සංචාරක ඉපැයීම් | - | 60 (ඇ) | - | 682 (ආ) | 141 (ඇ) | -79.3 |
| විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ | 612 | 271 | -55.6 | 6,291 | 5,166 | -17.9 |
| කොළඹ කොටස් වෙළඳපොළ වෙත වූ ලැබීම් (ශුද්ධ) (ඈ) | -15 | -20 | | -209 | -242 | |
| රාජ්‍ය අංශයේ ලැබීම් (දළ) | 90 | 84 | | 1,904 | 2,065 | |
| භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කර | 1 | - | | 103 | 16 | |
| දිගුකාලීන ණය | 89 | 84 | | 1,801 | 2,049 | |
| විදේශ සෘජු ආයෝජන (දළ) (ඉ) | | | | 543 | 567 | |
| සමස්ත ශේෂය | | | | -2,203 | -3,674 | |

**මූලයන්**: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, කොළඹ කොටස් වෙළඳපොළ, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) තාවකාලික

(ආ) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් 2020 වර්ෂය සඳහා සිදු කළ සමීක්ෂණයට අනුව ඇස්තමේන්තු කළ සංචාරකයෙකු මෙරට ගත කරන සාමාන්‍ය කාලය සහ සංචාරකයෙකුගේ සාමාන්‍ය දෛනික වියදමට අනුව සංශෝධිතය.

(ඇ) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් 2021 වර්ෂය සඳහා එහි සමීක්ෂණ ප්‍රතිඵල නිකුත් කිරීමෙන් පසු මෙම තාවකාලික ඇස්තමේන්තු සංශෝධනය විය හැකිය.

(ඈ) ප්‍රාථමික සහ ද්විතීයික ගනුදෙනු ඇතුළත් වේ.

(ඉ) සෑම වසරකම පළමු මාස නවය සඳහා දත්තවලට, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් වාර්තා කළ පරිදි සෘජු ආයෝජන සමාගම් වෙත වූ විදේශීය ණය සහ කොටස් වෙළඳපොළ වෙත වූ ශුද්ධ සෘජු ආයෝජන ඇතුළත් වේ.


ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වෙළඳ භාණ්ඩ ක්‍රියාකාරිත්වය පිළිබඳව වැඩිදුර තොරතුරු ඇතුළත් 'මාසික වෙළඳ විවරණිකාව' ප්‍රකාශයට පත් කරනු ලබන අතර එය ශ්‍රී ලංකා මහ බැංකුවේ වෙබ් අඩවියෙන් ලබා ගත හැකිය.
සංඛ්‍යාති > ආර්ථික දර්ශක > මාසික වෙළඳ විවරණිකාව (https://www.cbsl.gov.lk/si/node/6181).

## වෙළඳ භාණ්ඩ ශේෂය සහ වෙළඳ මිල අනුපාතය

**වෙළඳ ශේෂය:** වෙළඳ ගිණුමේ හිඟය, 2020 වසරේ නොවැම්බර් මාසයේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 600ට සාපේක්ෂව 2021 වසරේ නොවැම්බර් මාසයේ දී එ.ජ. ඩොලර් මිලියන 553ක් දක්වා අඩු විය. මේ අතර, 2021 වසරේ ජනවාරි සිට නොවැම්බර් දක්වා කාලය තුළ වෙළඳ ගිණුමේ සමස්ත හිඟය, 2020 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 5,446ක හිඟයට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 7,051ක් දක්වා පුළුල් විය. වෙළඳ ගිණුමේ සමස්ත හිඟය පුළුල් වීම සඳහා බලපෑ ප්‍රධාන අයිතම රූප සටහන 1 මගින් දැක්වේ.


**වෙළඳ මිල අනුපාතය:** අපනයන සහ ආනයන මිල ගණන් අතර අනුපාතය දැක්වෙන වෙළඳ මිල අනුපාතය, 2020 වසරේ නොවැම්බර් මාසයට සාපේක්ෂව 2021 වසරේ නොවැම්බර් මාසයේ දී සියයට 8.1කින් පහළ ගිය අතර, අපනයන මිල ගණන් ඉහළ යෑමට වඩා වැඩි වේගයකින් ආනයන මිල ගණන් ඉහළ යෑම මේ සඳහා හේතු විය.

**රූප සටහන 1: 2021 වසරේ ජනවාරි - නොවැම්බර් කාලපරිච්ඡේදය තුළ වෙළඳ හිඟය වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත ඉහළ යෑම සඳහා දායක වූ ප්‍රධාන අයිතම (අගය එ.ජ. ඩොලර් මිලියනවලින්)**





**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 2: මාසික වෙළඳ හිඟය (2020-2021)**




**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 3: වෙළඳ මිල අනුපාතය (2020-2021)**




**මූලය:** ශ්‍රී ලංකා මහ බැංකුව

## වෙළඳ භාණ්ඩ අපනයන ක්‍රියාකාරිත්වය[1]

**සමස්ත අපනයන**: **2021 වසරේ නොවැම්බර් මාසයේ දී අපනයන ආදයම, 2020 වසරේ නොවැම්බර් මාසයට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 1,211ක් දක්වා සියයට 54.6කින් වර්ධනය වූ අතර, මීට පෙර පැවති ඉහළම අගය වන, 2021 වසරේ ඔක්තෝබර් මාසයේ වාර්තා වූ (එ.ජ. ඩොලර් මිලියන 1,200ක) අගය ඉක්මවා ගියේය**. සියලුම ප්‍රධාන කාණ්ඩවල අපනයන ඉපැයීම්වල වර්ධනයක් දක්නට ලැබුණු අතර, මෙම ඉහළ යෑම සඳහා කාර්මික අපනයන ප්‍රධාන වශයෙන් දායක විය. 2021 වසරේ ජනවාරි සිට නොවැම්බර් දක්වා කාලය තුළ සමස්ත අපනයන ආදායම, 2020 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 11,345ක් දක්වා සියයට 24.9කින් ඉහළ ගියේය.

**කාර්මික අපනයන:** කාර්මික භාණ්ඩ අපනයන ආදායම, 2020 වසරේ නොවැම්බර් මාසයට සාපේක්ෂව 2021 වසරේ නොවැම්බර් මාසයේ දී සියයට 56.6කින් ඉහළ ගියේය. ප්‍රධාන වශයෙන්, ඇඟලුම්, ඛනිජ තෙල් නිෂ්පාදිත, රබර් නිෂ්පාදිත සහ සත්ත්ව ආහාර ඇතුළු බොහෝ කාර්මික නිෂ්පාදන කාණ්ඩවල ඉපැයීම් සමස්තයක් ලෙස ඉහළ යෑම මෙම වැඩි වීමට හේතු විය. කෙසේ වෙතත්, ප්ලාස්ටික් සහ ඒ ආශ්‍රිත නිෂ්පාදිත (ප්‍රධාන වශයෙන්, ප්ලාස්ටික් ඇඳුම් උපාංග) කාණ්ඩයේ ඉපැයීම්වල පහළ යෑමක් වාර්තා විය. සියලුම ප්‍රධාන වෙළඳපොළ වෙත සිදු කළ ඇඟලුම් අපනයන වර්ධනය විය. ඛනිජ තෙල් නිෂ්පාදිත අපනයනවලින් ලැබෙන ඉපැයීම් ඉහළ යෑම සඳහා නැව් සහ ගුවන්යානා සඳහා යොදාගනු ලබන ඉන්ධනවල මිල ගණන් ඉහළ යෑම සහ නැව් සඳහා යොදාගනු ලබන ඉන්ධනවල අපනයන පරිමා ඉහළ යෑම හේතු විය. රබර් නිෂ්පාදිත අපනයන ආදායම ඉහළ යෑම සඳහා ටයර් සහ අත්වැසුම්වලින් ලද ආදායම ඉහළ යෑම හේතු විය. ප්‍රධාන වශයෙන්, තිරිඟු අවශේෂ හේතුවෙන් සත්ත්ව ආහාර අපනයනයෙන් ලද ආදායම ඉහළ ගියේය.


**කෘෂිකාර්මික අපනයන**: කෘෂිකාර්මික භාණ්ඩ අපනයනයෙන් ලද සමස්ත අපනයන ආදායම, 2020 වසරේ නොවැම්බර් මාසයට සාපේක්ෂව 2021 වසරේ නොවැම්බර් මාසයේ දී සියයට 46.9කින් ඉහළ ගිය අතර, ඒ සඳහා ප්‍රධාන වශයෙන්, මුහුදු ආහාර (ප්‍රධාන වශයෙන්, නැවුම් සහ ශීත කළ කෙළවල්ලන්), තේ (ප්‍රධාන වශයෙන්, ඇසුරුම් කරන ලද කළු තේ), කුළුබඩු (ප්‍රධාන වශයෙන්, ගම්මිරිස්) සහ පොල් (ප්‍රධාන වශයෙන්, දිසිදි පොල්, පොල් කෙඳි සහ පොල්තෙල්) අපනයන ආදායම ඉහළ යෑම හේතු විය. ඒකක මිල ගණන් සුළු වශයෙන් පහළ ගිය ද, අපනයන පරිමාවන් (සියයට 27.9කින්) ඉහළ යෑම හේතුවෙන් 2021 වසරේ නොවැම්බර් මාසයේ දී තේ අපනයන ආදායම සියයට 22.3කින් (වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත) ඉහළ ගියේය.

**ඛනිජ අපනයන:** පාෂාණ හා ගල් වර්ග සහ වටිනා ලෝහ වර්ගවල අපනයන ආදායම ඉහළ යෑම හේතුවෙන් ඛනිජ අපනයන ආදායම, 2020 වසරේ නොවැම්බර් මාසයට සාපේක්ෂව 2021 වසරේ නොවැම්බර් මාසයේ දී සියයට 49.0කින් ඉහළ ගියේය.

[1] සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණය (සිව්වන සංස්කරණය) පදනම් කර ගත් අපනයන සංයුතිය ඇමුණුම Iහි දක්වා ඇත.


**අපනයන දර්ශක:** අපනයන ආදායම ඉහළ යෑම සඳහා අපනයන පරිමාවන් වඩා විශාල වශයෙන් හේතු වූ බව නිරූපණය කරමින්, 2021 වසරේ නොවැම්බර් මාසයේ දී (වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත) අපනයන පරිමා දර්ශකය සහ ඒකක මිල දර්ශකය, පිළිවෙළින්, සියයට 36.0කින් සහ සියයට 13.7කින් ඉහළ ගියේය.

**රූප සටහන 4: මාසික අපනයන ක්‍රියාකාරීත්වය**





**මූලයන්**: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 5: මාසික අපනයන පරිමා දර්ශකය**




**මූලය:** ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 6: මාසික අපනයන ඒකක මිල දර්ශකය**




**මූලය:** ශ්‍රී ලංකා මහ බැංකුව

**සංඛ්‍යා සටහන 2: වෙළඳ භාණ්ඩ අපනයන ආදායම (අ)**

| කාණ්ඩය | නොවැම්බර් 2020 (එ.ජ.ඩො. මිලියන) | නොවැම්බර් 2021 (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) | ජන.- නොවැ. 2020 (එ.ජ.ඩො. මිලියන) | ජන.- නොවැ. 2021 (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **1. කාර්මික අපනයන** | **597.4** | **935.4** | **56.6** | **6,916.5** | **8,788.4** | **27.1** |
| ආහාර, පාන වර්ග හා දුම්කොළ | 35.0 | 52.7 | 50.6 | 422.7 | 529.5 | 25.3 |
| සත්ත්ව ආහාර | 6.5 | 38.6 | 494.2 | 95.1 | 137.1 | 44.2 |
| රෙදිපිළි හා ඇඟලුම් | 326.2 | 498.1 | 52.7 | 3,971.3 | 4,901.9 | 23.4 |
| එයින්, ඇඟලුම් | 281.4 | 455.4 | 61.9 | 3,526.7 | 4,466.7 | 26.7 |
| රෙදිපිළි | 26.1 | 31.1 | 19.0 | 234.0 | 316.6 | 35.3 |
| අනෙකුත් නිම කළ රෙදිපිළි ද්‍රව්‍ය | 18.8 | 11.6 | -38.2 | 210.5 | 118.6 | -43.6 |
| රබර් නිෂ්පාදිත | 66.4 | 98.9 | 49.0 | 711.2 | 960.2 | 35.0 |
| මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ | 23.6 | 27.8 | 17.6 | 162.8 | 256.5 | 57.6 |
| යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ | 31.9 | 45.6 | 43.0 | 298.0 | 457.7 | 53.6 |
| ප්‍රවාහන උපකරණ | 5.9 | 12.1 | 105.7 | 64.6 | 138.6 | 114.6 |
| ඛනිජතෙල් නිෂ්පාදිත | 21.3 | 59.1 | 177.7 | 342.4 | 455.4 | 33.0 |
| රසායනික නිෂ්පාදිත | 16.3 | 19.4 | 19.2 | 156.0 | 201.5 | 29.1 |
| දැව හා කඩදාසි නිෂ්පාදිත | 7.1 | 12.3 | 74.0 | 89.6 | 117.9 | 31.7 |
| මුද්‍රණ කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත | 4.5 | 5.7 | 26.5 | 43.4 | 47.5 | 9.4 |
| සම් භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන් | 2.5 | 7.5 | 199.1 | 49.5 | 52.0 | 5.0 |
| ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 21.1 | 8.2 | -61.1 | 170.3 | 72.4 | -57.5 |
| මූල ලෝහ හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 8.4 | 16.6 | 96.8 | 98.8 | 141.3 | 43.1 |
| පිඟන්මැටි නිෂ්පාදිත | 2.6 | 3.4 | 29.8 | 20.8 | 34.4 | 65.2 |
| වෙනත් කාර්මික අපනයන | 18.1 | 29.4 | 62.8 | 220.2 | 284.5 | 29.2 |
| **2. කෘෂිකාර්මික අපනයන** | **183.1** | **268.9** | **46.9** | **2,132.9** | **2,497.2** | **17.1** |
| තේ | 96.2 | 117.6 | 22.3 | 1,128.0 | 1,213.7 | 7.6 |
| රබර් | 3.2 | 3.3 | 3.1 | 25.5 | 38.9 | 52.7 |
| පොල් | 28.6 | 40.8 | 42.7 | 318.4 | 393.9 | 23.7 |
| කුළුබඩු | 33.8 | 46.6 | 38.1 | 300.4 | 411.1 | 36.8 |
| එළවළු | 2.0 | 3.6 | 78.3 | 34.9 | 26.3 | -24.7 |
| සකස් නොකළ දුම්කොළ | 1.3 | 5.1 | 304.5 | 23.0 | 29.5 | 28.4 |
| සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත | 7.6 | 16.9 | 123.9 | 127.3 | 136.4 | 7.1 |
| මුහුදු ආහාර | 10.5 | 34.9 | 233.6 | 175.4 | 247.4 | 41.0 |
| **3. ඛනිජ අපනයන** | **2.3** | **3.5** | **49.0** | **20.5** | **39.5** | **92.8** |
| **4. වර්ග නොකළ අපනයන** | **0.9** | **3.6** | **315.5** | **13.1** | **20.3** | **55.4** |
| **මුළු අපනයන** | **783.7** | **1,211.5** | **54.6** | **9,083.0** | **11,345.4** | **24.9** |

(අ) තාවකාලික

**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හා අනෙකුත් ඛනිජ තෙල් අපනයනකරුවන්, ශ්‍රී ලංකා මහ බැංකුව

## වෙළඳ භාණ්ඩ ආනයන ක්‍රියාකාරිත්වය[2]

**සමස්ත ආනයන: 2020 වසරේ නොවැම්බර් මාසයේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 1,384 හා සැසඳීමේ දී, 2021 වසරේ නොවැම්බර් මාසයේ දී වෙළඳ භාණ්ඩ ආනයන වියදම එ.ජ. ඩොලර් මිලියන 1,765ක් දක්වා සියයට 27.5කින් ඉහළ ගියේය.** පාරිභෝගික භාණ්ඩ, අන්තර් භාණ්ඩ හා ආයෝජන භාණ්ඩ යන සියලුම ප්‍රධාන ආනයන කාණ්ඩවල ආනයන වියදමෙහි කැපී පෙනෙන වැඩිවීමක් දක්නට ලැබුණි. සමුච්චිත පදනම මත, 2021 වසරේ ජනවාරි සිට නොවැම්බර් දක්වා සමස්ත ආනයන වියදම, එ.ජ. ඩොලර් මිලියන 18,396ක් වූ අතර, එය 2020 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 14,529ක අගයට සාපේක්ෂව සියයට 26.6ක වර්ධනයක් වාර්තා කළේය.

**පාරිභෝගික භාණ්ඩ:** 2021 වසරේ නොවැම්බර් මාසයේ දී පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම, 2020 වසරේ නොවැම්බර් මාසයට සාපේක්ෂව සියයට 19.7කින් ඉහළ ගිය අතර, පෞද්ගලික භාවිතය සඳහා වන මෝටර් රථ ආනයනය කිරීම සැලකිය යුතු ලෙස අඩු වීම මධ්‍යයේ වුව ද, ආහාර හා ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම ඉහළ යෑම ඒ සඳහා හේතු විය. බෙහෙත් සහ ඖෂධීය නිෂ්පාදිත (ප්‍රධාන වශයෙන්, එන්නත්), විදුලි සංදේශ උපකරණ (ප්‍රධාන වශයෙන්, ජංගම දුරකථන), රෙදිපිළි සහ උපාංග (ප්‍රධාන වශයෙන්, යට ඇඳුම්) සහ ගෘහ උපකරණ (ප්‍රධාන වශයෙන්, රූපවාහිනී සහ ශීතකරණ) ඇතුළු ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ ප්‍රධාන කාණ්ඩ කිහිපයක ආනයන වියදම් ඉහළ යෑම් වාර්තා කළේය. මූලික වශයෙන්, සීනි සහ ධාන්‍ය වර්ග හා ඇඹරුම් කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත (ප්‍රධාන වශයෙන්, සහල්) ආනයනය හේතුවෙන් ආහාර සහ පාන වර්ග ආනයන වියදම සියයට 9.1කින් (වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත) ඉහළ ගියේය. මේ අතර, කිරි නිෂ්පාදිත (ප්‍රධාන වශයෙන්, කිරිපිටි), එළවළු (ප්‍රධාන වශයෙන්, මයිසූර් පරිප්පු සහ ලොකු ළූණු), තෙල් සහ මේද වර්ග (ප්‍රධාන වශයෙන්, පොල්තෙල්) සහ මුහුදු ආහාර (ප්‍රධාන වශයෙන්, කරවල) ආනයන වියදමෙහි පහළ යෑමක් දක්නට ලැබුණි

**අන්තර් භාණ්ඩ:** ප්‍රධාන වශයෙන්, ඉන්ධන, රෙදිපිළි සහ රෙදිපිළි උපාංග, රබර් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත සහ ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත හේතුවෙන්, 2021 වසරේ නොවැම්බර් මාසයේ දී අන්තර් භාණ්ඩ ආනයන වියදම, 2020 වසරේ නොවැම්බර් මාසයට සාපේක්ෂව සියයට 24.3කින් ඉහළ ගියේය. බොරතෙල් ආනයනය නොකිරීම මධ්‍යයේ වුව ද, 2021 වසරේ නොවැම්බර් මාසයේ දී ඉන්ධන ආනයන වියදම සියයට 78.0කින් ඉහළ ගිය අතර, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත, පිරිපහදු කළ ඛනිජ තෙල් නිෂ්පාදිත ආනයන පරිමාව සහ මිල ගණන්, පිළිවෙළින්, සියයට 104.8කින් සහ සියයට 53.7කින් ඉහළ යෑම මේ සඳහා හේතු විය. මේ අතර, 2021 වසරේ නොවැම්බර් මාසය තුළ පොහොර සහ මූල ලෝහ (ප්‍රධාන වශයෙන්, යකඩ සහ වානේ) ඇතුළු ඇතැම් කාණ්ඩවල ආනයන වියදම් පහළ ගියේය.

**ආයෝජන භාණ්ඩ:** 2021 වසරේ නොවැම්බර් මාසයේ දී ආයෝජන භාණ්ඩ ආනයන වියදම, 2020 වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 40.2කින් ඉහළ ගිය අතර මේ සඳහා යන්ත්‍රසූත්‍ර සහ උපකරණ, ගොඩනැගිලි ද්‍රව්‍ය සහ ප්‍රවාහන උපකරණ යන ආයෝජන භාණ්ඩ කාණ්ඩ තුනෙහිම සැලකිය යුතු

---


[2] සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණය (සිව්වන සංස්කරණය) පදනම් කර ගත් ආනයන සංයුතිය ඇමුණුම IIහි දක්වා ඇත.

.

වර්ධනය හේතු විය. සම්ප්‍රේෂණ යන්ත්‍රවල අඩුවීමක් වාර්තා වුව ද, යන්ත්‍රසූත්‍ර සහ උපකරණ ආනයන වියදම් වැඩිවීම සඳහා යන්ත්‍රසූත්‍ර සහ උපකරණ කොටස්, කාර්යාල උපකරණ, ඉංජිනේරු උපකරණ, කෘෂිකාර්මික යන්ත්‍රසූත්‍ර සහ රෙදිපිළි කර්මාන්තය ආශ්‍රිත යන්ත්‍රසූත්‍ර ප්‍රධාන වශයෙන් හේතු විය. ගොඩනැගිලි ද්‍රව්‍ය යටතේ වන සියලුම උප අංශවල ආනයන වියදම, 2020 වසරේ නොවැම්බර් මාසයට සාපේක්ෂව 2021 වසරේ නොවැම්බර් මාසයේ දී ඉහළ ගිය අතර, යකඩ සහ වානේ හා යකඩ සහ ඒ ආශ්‍රිත උපාංග ආනයන වියදම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. ප්‍රධාන වශයෙන්, දුම්රිය උපකරණ ආනයනය හේතුවෙන් ප්‍රවාහන උපකරණ ආනයන වියදම ද ඉහළ ගියේය.


**ආනයන දර්ශක:** 2021 වසරේ නොවැම්බර් මාසයේ දී (වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත) ආනයන පරිමා දර්ශකය සහ ඒකක මිල දර්ශකය, පිළිවෙළින්, සියයට 3.1කින් සහ 23.6කින් ඉහළ ගියේය. 2021 වසරේ නොවැම්බර් මාසයේ දී ආනයන වියදම වැඩිවීම, ප්‍රධාන වශයෙන් මිල බලපෑම මත සිදු වූ බව එයින් පිළිඹිබු විය.

**රූප සටහන 7: මාසික ආනයන ක්‍රියාකාරිත්වය**





මූලයන්: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 8: මාසික ආනයන පරිමා දර්ශකය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 9: මාසික ආනයන ඒකක මිල දර්ශකය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**සංඛ්‍යා සටහන 3: වෙළඳ භාණ්ඩ ආනයන වියදම (අ)**

| භාණ්ඩය | නොවැම්බර් 2020 (එ.ජ.ඩො. මිලියන) | නොවැම්බර් 2021 (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) | ජන.- නොවැ. 2020 (එ.ජ.ඩො. මිලියන) | ජන.- නොවැ. 2021 (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **1. පාරිභෝගික භාණ්ඩ** | **255.5** | **305.8** | **19.7** | **3,073.9** | **3,429.4** | **11.6** |
| ආහාර හා පාන වර්ග | 124.6 | 135.9 | 9.1 | 1,396.3 | 1,495.3 | 7.1 |
| ධාන්‍ය හා ඇඹරුම් කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත | 2.7 | 15.1 | 456.0 | 30.1 | 46.5 | 54.3 |
| කිරි ආශ්‍රිත නිෂ්පාදිත | 29.4 | 10.0 | -66.0 | 302.7 | 303.6 | 0.3 |
| එළවළු (ආ) | 33.2 | 29.6 | -10.9 | 313.3 | 351.1 | 12.1 |
| මුහුදු ආහාර | 10.7 | 9.3 | -12.7 | 175.6 | 112.1 | -36.2 |
| සීනි හා රසකැවිලි | 14.0 | 30.6 | 118.4 | 247.4 | 255.5 | 3.3 |
| කුළුබඩු | 9.3 | 12.4 | 33.3 | 115.3 | 120.2 | 4.2 |
| වෙනත් ආහාර හා පාන වර්ග | 25.2 | 28.9 | 14.5 | 211.9 | 306.4 | 44.6 |
| ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ | 130.9 | 169.9 | 29.8 | 1,677.6 | 1,934.2 | 15.3 |
| පෞද්ගලික රථවාහන | 0.5 | 0.7 | 49.4 | 282.4 | 12.2 | -95.7 |
| බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත | 46.9 | 64.6 | 37.7 | 540.5 | 754.0 | 39.5 |
| ගෘහ උපකරණ | 17.5 | 22.2 | 26.5 | 151.7 | 235.6 | 55.2 |
| රෙදිපිළි හා උපාංග | 16.5 | 21.3 | 29.4 | 182.3 | 198.0 | 8.6 |
| විදුලි සංදේශ උපකරණ | 20.4 | 28.2 | 38.2 | 231.1 | 351.9 | 52.3 |
| ගෘහ හා දැව භාණ්ඩ | 11.2 | 13.1 | 16.8 | 129.2 | 144.6 | 11.9 |
| වෙනත් ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ | 17.9 | 19.8 | 10.7 | 160.3 | 237.9 | 48.4 |
| **2. අන්තර් භාණ්ඩ** | **818.3** | **1,017.2** | **24.3** | **8,211.6** | **10,940.7** | **33.2** |
| ඉන්ධන | 178.9 | 318.6 | 78.0 | 2,307.5 | 3,300.4 | 43.0 |
| එයින්, බොරතෙල් | 65.7 | - | - | 544.9 | 565.3 | 3.8 |
| පිරිපහදු කළ ඛනිජතෙල් | 98.1 | 308.6 | 214.6 | 1,579.3 | 2,500.1 | 58.3 |
| ගල්අඟුරු | 15.1 | 10.0 | -34.2 | 183.3 | 234.9 | 28.2 |
| දියමන්ති, අගනා ගල් වර්ග හා ලෝහ වර්ග | 25.4 | 16.6 | -34.6 | 106.1 | 129.8 | 22.3 |
| රෙදිපිළි හා රෙදිපිළි උපාංග | 216.6 | 297.3 | 37.3 | 2,100.2 | 2,769.0 | 31.8 |
| කඩදාසි හා ඝන කඩදාසි | 34.4 | 39.0 | 13.5 | 346.5 | 431.3 | 24.5 |
| කෘෂිකාර්මික යෙදවුම් | 16.4 | 18.5 | 12.7 | 178.3 | 241.4 | 35.4 |
| තිරිඟු හා ඉරිඟු | 28.4 | 26.6 | -6.3 | 342.5 | 388.0 | 13.3 |
| මූල ලෝහ | 41.3 | 23.2 | -43.9 | 426.6 | 678.9 | 59.1 |
| ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 47.2 | 64.2 | 36.0 | 487.5 | 688.1 | 41.1 |
| රසායනික නිෂ්පාදිත | 79.5 | 85.3 | 7.3 | 749.4 | 974.5 | 30.0 |
| පොහොර | 67.0 | 1.4 | -97.9 | 228.5 | 121.3 | -46.9 |
| රබර් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 15.7 | 38.1 | 143.0 | 198.4 | 361.5 | 82.2 |
| ඛනිජ නිෂ්පාදිත | 12.1 | 19.2 | 59.2 | 155.6 | 145.1 | -6.8 |
| වෙනත් අන්තර් භාණ්ඩ | 55.4 | 69.2 | 25.0 | 584.4 | 711.3 | 21.7 |
| **3. ආයෝජන භාණ්ඩ** | **309.4** | **433.7** | **40.2** | **3,230.3** | **4,009.8** | **24.1** |
| යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 200.1 | 246.9 | 23.4 | 1,964.9 | 2,501.8 | 27.3 |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 78.7 | 120.7 | 53.4 | 930.9 | 1,124.8 | 20.8 |
| ප්‍රවාහන උපකරණ | 30.3 | 65.3 | 115.4 | 331.7 | 377.7 | 13.9 |
| වෙනත් ආයෝජන භාණ්ඩ | 0.3 | 0.8 | 168.1 | 2.9 | 5.5 | 88.0 |
| **4. වර්ග නොකළ ආනයන** | **0.4** | **7.9** | **1,668.3** | **12.9** | **16.6** | **28.9** |
| **මුළු ආනයන** | **1,383.7** | **1,764.6** | **27.5** | **14,528.7** | **18,396.4** | **26.6** |
| **එයින් ඉන්ධන නොවන ආනයන** | **1,204.8** | **1,446.1** | **20.0** | **12,221.2** | **15,096.1** | **23.5** |

(අ) තාවකාලික
(ආ) පරිප්පු, ළූණු, අර්තාපල්, රනිල කුලයට අයත් එළවළු සහ වෙනත් එළවළු ඇතුළත් වේ.


**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ලංකා අයි.ඕ.සී. සමාගම, ශ්‍රී ලංකා මහ බැංකුව

## ජංගම ගිණුම වෙත වාර්තා වූ අනෙකුත් ප්‍රධාන ලැබීම්

**විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ:** 2021 වසරේ නොවැම්බර් මාසයේ දී විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ අඩු විය. ඒ අනුව, 2020 වසරේ නොවැම්බර් මාසයේ දී වූ එ.ජ. ඩොලර් මිලියන 612ට සාපේක්ෂව විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ 2021 වසරේ නොවැම්බර් මාසයේ දී එ.ජ. ඩොලර් මිලියන 271ක් විය. සමුච්චිත පදනම මත, 2021 වසරේ ජනවාරි සිට නොවැම්බර් දක්වා කාලය තුළ දී විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ එ.ජ. ඩොලර් මිලියන 5,166ක් වූ අතර, එය පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 17.9ක අඩුවීමකි. ප්‍රධාන වශයෙන් පුහුණු (6,215), ගෘහ සේවිකා (5,507) සහ නුපුහුණු (4,889) යන කාණ්ඩ වල දායකත්වයෙන්, විදේශ රැකියා සඳහා පිටත්ව යෑමේ සමස්තය, 2021 වසරේ නොවැම්බර් මාසය තුළ දී පෙර මාසයට සාපේක්ෂව 19,805ක් දක්වා සියයට 25.9කින් වර්ධනය විය. මේ අතර, 2021 දෙසැම්බර් මාසයේ දී විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ එ.ජ. ඩොලර් මිලියන 325ක් විය. සමුච්චිත පදනම මත, විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ 2020 වසරේ එ.ජ. ඩොලර් මිලියන 7,104ට සාපේක්ෂව 2021 වසරේ එ.ජ. ඩොලර් මිලියන 5,491ක් විය.


**සංචාරක පැමිණීම්:** 2021 වසරේ ඔක්තෝබර් මාසයේ වාර්තා වූ 22,771ක සංචාරක පැමිණීම් ප්‍රමාණයට සාපේක්ෂව, 2021 වසරේ නොවැම්බර් මාසයේ දී පැමිණි සංචාරකයන් ප්‍රමාණය 44,294ක් ලෙස වාර්තා විය. 2020 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ පැමිණි මුළු සංචාරක පැමිණීම් 507,311ක ප්‍රමාණයට සාපේක්ෂව 2021 වසරේ නොවැම්බර් මාසය දක්වා වූ මාස එකොළහ තුළ පැමිණි මුළු සංචාරක පැමිණීම් ප්‍රමාණය 104,989ක් ලෙස වාර්තා විය. 2021 වසරේ නොවැම්බර් මාසය තුළ වැඩිම සංචාරකයන් ප්‍රමාණයක් පැමිණි රටවල් ලෙස ඉන්දියාව, එක්සත් රාජධානිය, රුසියාව, ජර්මනිය සහ පාකිස්ථානය පැවතුණි. 2021 වසරේ නොවැම්බර් මාසය සඳහා සංචාරක ඉපැයීම් එ.ජ. ඩොලර් මිලියන 60ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. 2020 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 682ට සාපේක්ෂව, 2021 වසරේ නොවැම්බර් මාසය දක්වා වූ මාස එකොළහ තුළ සමස්ත සංචාරක ඉපැයීම් ප්‍රමාණය එ.ජ. ඩොලර් මිලියන 141ක් පමණ වනු ඇතැයි ඇස්තමේන්තු කර ඇත. 2021 වසරේ දෙසැම්බර් මාසයේ දී සංචාරක පැමිණීම් 89,506ක් ලෙස වාර්තා වූ අතර, 2020 වසර තුළ පැමිණි මුළු සංචාරක පැමිණීම් 507,704ට සාපේක්ෂව 2021 වසර තුළ 194,495ක් ලෙස වාර්තා විය. 2021 වසරේ දෙසැම්බර් මාසය සඳහා සංචාරක ඉපැයීම් එ.ජ. ඩොලර් මිලියන 120ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. 2020 වසරේ වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 682ට සාපේක්ෂව, 2021 වසරේ දී සංචාරක ඉපැයීම් එ.ජ. ඩොලර් මිලියන 261ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

**රූප සටහන 10: 2021 වසරේ දී මාසික සංචාරක පැමිණීම්**




**මූලය:** ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

**රූප සටහන 11: සංචාරක ඉපැයීම් සහ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ**




**මූලයන්:** ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, බලපත්‍රලාභී බැංකු, ශ්‍රී ලංකා මහ බැංකුව


## මූලය ලැබීම්

2021 වසරේ නොවැම්බර් මාසය තුළ රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළෙහි විදේශීය ආයෝජන ශුද්ධ ගෙවීම් සුළු ප්‍රමාණයක් වාර්තා විය. 2021 වසරේ මාස එකොළහ තුළ රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ වෙතින් එ.ජ. ඩොලර් මිලියන 28ක සමස්ත ශුද්ධ ගෙවීමක් වාර්තා වූ අතර, නොපියවා ඉතිරිව ඇති විදේශීය ආයෝජන ප්‍රමාණය 2021 වසරේ නොවැම්බර් මාසය අවසානයේ දී එ.ජ. ඩොලර් මිලියන 9ක් ලෙස අඩු මට්ටමක පැවතුණි. මේ අතර, 2021 වසරේ නොවැම්බර් මාසයේ දී කොළඹ කොටස් වෙළඳපොළ වෙතින් එ.ජ. ඩොලර් මිලියන 20ක ශුද්ධ ගෙවීමක් වාර්තා වූ අතර, එහි ප්‍රතිඵලයක් වශයෙන් 2021 වසරේ නොවැම්බර් දක්වා වූ මාස එකොළහ තුළ එ.ජ. ඩොලර් මිලියන 242ක ශුද්ධ ගෙවීමක් සිදු විය.

## ජාත්‍යන්තර සංචිත

චීන මහජන බැංකුව සහ ශ්‍රී ලංකා මහ බැංකුව අතර අත්සන් කළ යුවාන් බිලියන 10ක (ආසන්න වශයෙන් එ.ජ. ඩොලර් බිලියන 1.5ක) තුන් අවුරුදු ද්වීපාර්ශ්වික විනිමය හුවමාරු පහසුකම හැර 2021 වසරේ නොවැම්බර් මාසය අවසන් වන විට දළ නිල සංචිත ප්‍රමාණය එ.ජ. ඩොලර් බිලියන 1.6ක් විය. දළ නිල සංචිත හා බැංකු අංශයේ විදේශීය වත්කම් වලින් සමන්විත වන මුළු විදේශීය වත්කම් ප්‍රමාණය 2021 වසරේ නොවැම්බර් මාසය අවසානයේ දී එ.ජ. ඩොලර් බිලියන 4.8ක් විය. 2021 වසරේ දෙසැම්බර් මාසය තුළ චීන මහජන බැංකුව සමඟ විනිමය හුවමාරු පහසුකම සක්‍රීය කිරීමත් සමඟ, 2021 වසර අවසානයේ දී දළ නිල සංචිත මට්ටම එ.ජ. ඩොලර් බිලියන 3.1 දක්වා වැඩි වී ඇතැයි ඇස්තමේන්තු කර ඇත.

**රූප සටහන 12: දළ නිල සංචිත සහ සංචිත ප්‍රමාණාත්මකභාවය**





**මූලය:** ශ්‍රී ලංකා මහ බැංකුව

## විනිමය අනුපාතිකයෙහි හැසිරීම

**අන්තර් බැංකු වෙළඳපොළෙහි බර තැබූ සාමාන්‍ය එතැන් විනිමය අනුපාතිකය එ.ජ. ඩොලරයකට රු. 200ත් රු. 203ත් අතර පරාසය තුළ ස්ථාවරව පැවතුණි.** 2021 වසරේ දී එ.ජ. ඩොලරයට සාපේක්ෂව රුපියලේ සමස්ත වාර්ෂික අවප්‍රමාණය වීම සියයට 7.0කට සීමා විය. අනෙකුත් විදේශ ව්‍යවහාර මුදල්වල හැසිරීම පිළිබිඹු කරමින්, 2021 වසරේ දී ශ්‍රී ලංකා රුපියල, ස්ටර්ලින් පවුම, ඕස්ට්‍රේලියානු ඩොලරය සහ ඉන්දියානු රුපියලට සාපේක්ෂව අවප්‍රමාණය වූ අතර, යූරෝ සහ ජපන් යෙන්වලට සාපේක්ෂව අතිප්‍රමාණය විය. මේ අතර, 2022 ජනවාරි 25 දක්වා වූ කාලය තුළ දී ශ්‍රී ලංකා රුපියල, එ.ජ. ඩොලරයට සාපේක්ෂව සියයට 0.8ක අවප්‍රමාණය වීමක් වාර්තා කළේය. අනෙකුත් විදේශ ව්‍යවහාර මුදල්වල හැසිරීම පිළිබිඹු කරමින්, 2022 ජනවාරි 25වන දින දක්වා කාලය තුළ දී ශ්‍රී ලංකා රුපියල, යූරෝ, ස්ටර්ලින් පවුම, ජපන් යෙන් සහ ඉන්දියානු රුපියලට සාපේක්ෂව අවප්‍රමාණය වූ අතර, ඕස්ට්‍රේලියානු ඩොලරයට සාපේක්ෂව අතිප්‍රමාණය විය.

**රූප සටහන 13: එ.ජ. ඩොලරයට සාපේක්ෂව රුපියලෙහි වෙනස් වීම**




**මූලය:** ශ්‍රී ලංකා මහ බැංකුව

**සංඛ්‍යා සටහන 4: තෝරාගත් ව්‍යවහාර මුදල් ඒකකවලට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලෙහි වෙනස් වීම**

| මුදල් ඒකකය | 2020 | 2021 | 2022 (ජනවාරි 25 දක්වා) අවප්‍රමාණය (-)/ අතිප්‍රමාණය (+) |
|---|---|---|---|
| එ.ජ. ඩොලරය | -2.6% | -7.0% | -0.8% |
| යූරෝ | -11.2% | +1.1% | -0.7% |
| ස්ටර්ලින් පවුම | -6.2% | -6.0% | -0.6% |
| ජපන් යෙන් | -7.5% | +3.8% | -1.9% |
| ඕස්ට්‍රේලියානු ඩොලරය | -11.4% | -1.2% | +0.6% |
| ඉන්දියානු රුපියල | 0.0% | -5.5% | -0.5% |

**මූලය:** ශ්‍රී ලංකා මහ බැංකුව

**ඇමුණුම I:**

**සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණයට (සිව්වන සංස්කරණය) අනුව අපනයන සංයුතිය (අ)**

| කාණ්ඩය | නොවැම්බර් 2020 (එ.ජ.ඩො. මිලියන) | නොවැම්බර් 2021 (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) | ජන.- නොවැ. 2020 (එ.ජ.ඩො. මිලියන) | ජන.- නොවැ. 2021 (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **0. ආහාර හා සජීවී සතුන්** | 185.6 | 302.9 | 63.2 | 2,203.3 | 2,600.0 | 18.0 |
| 03 මත්ස්‍යයින් හා ඒ ආශ්‍රිත සැකසුම් | 12.1 | 40.2 | 232.0 | 198.2 | 284.8 | 43.7 |
| 04 ධාන්‍ය හා ධාන්‍ය සැකසුම් | 6.0 | 8.1 | 35.3 | 58.2 | 65.5 | 12.7 |
| 05 එළවළු හා පලතුරු | 28.3 | 45.6 | 61.3 | 366.6 | 429.8 | 17.2 |
| 07 කෝපි, තේ, කොකෝවා, කුළුබඩු හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 128.6 | 161.8 | 25.8 | 1,399.5 | 1,592.6 | 13.8 |
| **1. පාන වර්ග හා දුම්කොළ** | 6.9 | 14.9 | 115.1 | 103.8 | 127.6 | 22.9 |
| 11 පාන වර්ග | 2.4 | 3.9 | 61.1 | 28.9 | 29.9 | 3.5 |
| 12 දුම්කොළ හා දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදිත | 4.5 | 11.1 | 143.8 | 75.0 | 97.7 | 30.3 |
| **2. ඉන්ධන හැර ආහාරයට නුසුදුසු සකස් නොකළ ද්‍රව්‍ය** | 35.1 | 39.1 | 11.3 | 336.3 | 397.2 | 18.1 |
| 23 සකස් නොකළ රබර් | 3.3 | 3.4 | 1.4 | 26.3 | 39.8 | 50.9 |
| 26 රෙදිපිළි සඳහා යොදාගනු ලබන කෙඳි වර්ග හා ඒවායේ අපද්‍රව්‍ය | 22.9 | 20.9 | -8.7 | 216.7 | 223.0 | 2.9 |
| **3. ඛනිජමය ඉන්ධන, ලිහිසි ද්‍රව්‍ය හා ඒ ආශ්‍රිත ද්‍රව්‍ය** | 21.3 | 59.1 | 177.7 | 342.4 | 455.4 | 33.0 |
| 33 ඛනිජ තෙල්, ඛනිජ තෙල් නිෂ්පාදිත හා ඒ ආශ්‍රිත ද්‍රව්‍ය | 21.3 | 52.4 | 146.6 | 323.3 | 411.9 | 27.4 |
| 34 ස්වාභාවික හා නිෂ්පාදිත ගෑස් වර්ග | - | 6.6 | - | 19.1 | 43.5 | 127.5 |
| **4. සත්ත්ව හා එළවළු තෙල්, මේද හා ඉටි** | 9.3 | 11.6 | 25.5 | 87.3 | 117.2 | 34.3 |
| 42 පිරිපහදු කළ හෝ නොකළ, නිස්සාරණයට ලක් කළ ස්ථායී එළවළු මේද හා තෙල් | 7.4 | 10.1 | 37.2 | 72.7 | 79.1 | 8.9 |
| **5. රසායනික ද්‍රව්‍ය හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවන)** | 19.7 | 26.1 | 32.6 | 202.3 | 262.0 | 29.5 |
| **6. ප්‍රධාන වශයෙන්ම ද්‍රව්‍ය අනුව වර්ග කර ඇති නිෂ්පාදන භාණ්ඩ** | 119.1 | 161.1 | 35.2 | 1,221.4 | 1,549.2 | 26.8 |
| 62 රබර් නිෂ්පාදන (අන් තැනක සඳහන් නොවන) | 43.3 | 65.5 | 51.3 | 491.5 | 623.9 | 26.9 |
| 65 රෙදිපිළි සඳහා යොදාගනු ලබන නූල්, රෙදි, සකස් කරන ලද උපාංග, හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවන) | 36.2 | 40.5 | 11.8 | 388.3 | 413.5 | 6.5 |
| 66 ලෝහමය නොවන ඛනිජ නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවන) | 27.4 | 31.9 | 16.5 | 194.2 | 309.2 | 59.2 |
| **7. යන්ත්‍රසූත්‍ර හා ප්‍රවාහන උපකරණ** | 37.2 | 56.6 | 51.9 | 350.8 | 580.2 | 65.4 |
| 77 විද්‍යුත් යන්ත්‍රසූත්‍ර, උපකරණ හා උපාංග සහ ඒ ආශ්‍රිත විද්‍යුත් කොටස් (අන් තැනක සඳහන් නොවන) | 19.3 | 28.8 | 49.0 | 214.7 | 290.8 | 35.5 |
| **8. විවිධ නිෂ්පාදන උපාංග** | 349.5 | 539.7 | 54.4 | 4,235.4 | 5,255.3 | 24.1 |
| 84 නිමි ඇඳුම් හා ඇඟලුම් සකස් කිරීමට ගන්නා උපාංග | 322.8 | 495.8 | 53.6 | 3,896.4 | 4,840.9 | 24.2 |
| **9. සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණයෙහි වෙනත් ස්ථානයක සඳහන් නොවන වෙළඳ භාණ්ඩ හා ගනුදෙනු** | - | 0.5 | - | ... | 1.3 | 3815.4 |
| **මුළු අපනයන** | 783.7 | 1,211.5 | 54.6 | 9,083.0 | 11,345.4 | 24.9 |

(අ) තාවකාලික
... සැලකිය යුතු නොවේ

**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හා අනෙකුත් ඛනිජ තෙල් අපනයනකරුවන්, ශ්‍රී ලංකා මහ බැංකුව

සටහන: සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණයෙහි පළමු අංකයෙන් අංශය ද පළමු අංක දෙකෙන් කාණ්ඩය ද දැක් වේ. තෝරා ගත් කාණ්ඩ පමණක් ඉහත සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත. සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණය පිළිබඳ තවදුරටත් දැන ගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාව 2017 හි විශේෂ සටහන 04 බලන්න.
https://www.cbsl.gov.lk/sites/default/files/cbslweb_documents/publications/annual_report/2017/si/9_Chapter_05.pdf

**ඇමුණුම II:**

## සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණයට (සිව්වන සංස්කරණය) අනුව ආනයන සංයුතිය (අ)

| කාණ්ඩය | නොවැම්බර් 2020 (එ.ජ.ඩො. මිලියන) | නොවැම්බර් 2021 (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) | ජන.- නොවැ. 2020 (එ.ජ.ඩො. මිලියන) | ජන.- නොවැ. 2021 (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **0. ආහාර හා සජීවී සතුන්** | **161.3** | **175.2** | **8.6** | **1,899.5** | **2,045.0** | **7.7** |
| 02 කිරි ආශ්‍රිත නිෂ්පාදිත හා කුරුලු බිත්තර | 29.4 | 10.1 | -65.8 | 303.1 | 304.0 | 0.3 |
| 03 මත්ස්‍යයින් හා ඒ ආශ්‍රිත සැකසුම් | 10.8 | 9.5 | -11.8 | 176.5 | 113.2 | -35.9 |
| 04 ධාන්‍ය හා ධාන්‍ය සැකසුම් | 30.9 | 41.2 | 33.1 | 370.2 | 432.3 | 16.8 |
| 05 එළවළු හා පලතුරු | 39.1 | 38.3 | -2.1 | 374.3 | 415.7 | 11.1 |
| 06 සීනි, සීනි ආශ්‍රිත සැකසුම් හා පැණි | 14.0 | 30.6 | 118.4 | 247.4 | 255.5 | 3.3 |
| 07 කෝපි, තේ, කොකෝවා, කුළුබඩු හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 11.9 | 15.4 | 29.4 | 146.7 | 157.3 | 7.3 |
| **1. පාන වර්ග හා දුම්කොළ** | **5.9** | **6.8** | **13.9** | **86.3** | **69.0** | **-20.1** |
| **2. ඉන්ධන හැර ආහාරයට නුසුදුසු සකස් නොකළ ද්‍රව්‍ය** | **29.6** | **58.2** | **96.5** | **399.9** | **528.4** | **32.1** |
| 23 සකස් නොකළ රබර් | 12.9 | 33.2 | 158.1 | 165.4 | 316.9 | 91.6 |
| 26 රෙදිපිළි සඳහා යොදාගනු ලබන කෙඳි වර්ග හා ඒවායේ අපද්‍රව්‍ය | 2.8 | 2.2 | -23.7 | 73.8 | 22.3 | -69.8 |
| **3. ඛනිජමය ඉන්ධන, ලිහිසි ද්‍රව්‍ය හා ඒ ආශ්‍රිත ද්‍රව්‍ය** | **178.9** | **318.6** | **78.0** | **2,307.5** | **3,300.4** | **43.0** |
| 33 ඛනිජ තෙල්, ඛනිජ තෙල් නිෂ්පාදිත හා ඒ ආශ්‍රිත ද්‍රව්‍ය | 135.5 | 274.8 | 102.8 | 1,884.3 | 2,740.0 | 45.4 |
| 34 ස්වාභාවික හා නිෂ්පාදිත ගෑස් වර්ග | 28.3 | 33.8 | 19.5 | 240.0 | 325.5 | 35.7 |
| **4. සත්ත්ව හා එළවළු තෙල්, මේද හා ඉටි** | **24.3** | **30.4** | **25.1** | **172.8** | **276.4** | **60.0** |
| 42 පිරිපහදු කළ හෝ නොකළ, නිස්සාරණයට ලක් කළ ස්ථාවර එළවළු මේද හා තෙල් | 23.3 | 29.1 | 24.8 | 164.7 | 255.1 | 54.9 |
| **5. රසායනික ද්‍රව්‍ය හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවන)** | **237.0** | **213.7** | **-9.8** | **1,974.2** | **2,502.7** | **26.8** |
| 54 බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත | 42.3 | 58.7 | 38.7 | 498.1 | 698.3 | 40.2 |
| 56 පොහොර | 67.0 | 1.3 | -98.0 | 228.2 | 120.8 | -47.1 |
| 57 ප්‍රාථමික ස්වරූපයෙන් පවතින ප්ලාස්ටික් | 32.1 | 46.3 | 43.9 | 330.7 | 502.5 | 51.9 |
| 58 ප්‍රාථමික නොවන ස්වරූපයෙන් පවතින ප්ලාස්ටික් | 11.7 | 17.5 | 49.8 | 129.6 | 155.3 | 19.8 |
| **6. ප්‍රධාන වශයෙන්ම ද්‍රව්‍ය අනුව වර්ග කර ඇති නිෂ්පාදන භාණ්ඩ** | **414.2** | **505.3** | **22.0** | **4,039.9** | **5,301.0** | **31.2** |
| 64 කඩදාසි, ඝන කඩදාසි හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 32.3 | 35.1 | 8.9 | 333.5 | 407.1 | 22.1 |
| 65 රෙදිපිළි සඳහා යොදාගනු ලබන නූල්, රෙදි, සකස් කරන ලද උපාංග, හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවන) | 211.7 | 290.2 | 37.1 | 2,024.0 | 2,715.7 | 34.2 |
| 66 ලෝහමය නොවන ඛනිජ නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවන) | 49.0 | 52.8 | 7.6 | 479.7 | 475.5 | -0.9 |
| 67 යකඩ හා වානේ | 63.3 | 51.0 | -19.5 | 571.5 | 859.0 | 50.3 |
| **7. යන්ත්‍රසූත්‍ර හා ප්‍රවාහන උපකරණ** | **262.2** | **361.5** | **37.9** | **2,919.6** | **3,491.1** | **19.6** |
| 72 ඇතැම් කර්මාන්ත සඳහා විශේෂයෙන් සකස් කරන ලද යන්ත්‍රසූත්‍ර | 37.5 | 60.6 | 61.5 | 384.2 | 594.1 | 54.6 |
| 74 සාමාන්‍ය කාර්මික යන්ත්‍රසූත්‍ර හා උපකරණ සහ යන්ත්‍ර කොටස් (අන් තැනක සඳහන් නොවන) | 43.3 | 45.3 | 4.6 | 468.1 | 546.3 | 16.7 |
| 75 කාර්යාලයීය යන්ත්‍රසූත්‍ර හා ස්වයංක්‍රීය දත්ත සැකසුම් යන්ත්‍ර | 33.5 | 41.2 | 23.1 | 195.9 | 310.3 | 58.4 |
| 76 විදුලි සන්දේශ සහ ශබ්ද පටිගත කිරීම හා ප්‍රතිනිෂ්පාදන කටයුතු සඳහා යොදාගනු ලබන උපකරණ | 53.8 | 57.3 | 6.5 | 450.9 | 714.2 | 58.4 |
| 77 විද්‍යුත් යන්ත්‍රසූත්‍ර, උපකරණ හා උපාංග (අන් තැනක සඳහන් නොවන) සහ ඒ ආශ්‍රිත විද්‍යුත් කොටස් | 54.4 | 69.2 | 27.1 | 509.7 | 667.8 | 31.0 |
| 78 රථවාහන | 26.4 | 22.9 | -13.3 | 543.1 | 306.4 | -43.6 |
| **8. විවිධ නිෂ්පාදන උපාංග** | **68.0** | **87.3** | **28.3** | **713.4** | **864.7** | **21.2** |
| 84 නිමි ඇඳුම් හා ඇඟලුම් සකස් කිරීමට ගන්නා උපාංග | 14.1 | 19.0 | 35.0 | 154.5 | 170.6 | 10.4 |
| 87 වෘත්තීමය, විද්‍යාත්මක හා පාලන මෙවලම් සහ උපකරණ (අන් තැනක සඳහන් නොවන) | 15.0 | 19.8 | 31.9 | 169.2 | 219.9 | 29.9 |
| **9. සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණයෙහි වෙනත් ස්ථානයක සඳහන් නොවන වෙළඳ භාණ්ඩ හා ගනුදෙනු** | **2.3** | **7.8** | **244.7** | **15.7** | **17.8** | **13.1** |
| **මුළු ආනයන** | **1,383.7** | **1,764.6** | **27.5** | **14,528.7** | **18,396.4** | **26.6** |

(අ) තාවකාලික

**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ලංකා අයි.ඕ.සී. සමාගම, ශ්‍රී ලංකා මහ බැංකුව

සටහන: සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණයෙහි පළමු අංකයෙන් අංශය ද පළමු අංක දෙකෙන් කාණ්ඩය ද දැක් වේ. තෝරා ගත් කාණ්ඩ පමණක් ඉහත සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත. සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණය පිළිබඳ තවදුරටත් දැන ගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාව 2017හි විශේෂ සටහන 04 බලන්න.
https://www.cbsl.gov.lk/sites/default/files/cbslweb_documents/publications/annual_report/2017/si/9_Chapter_05.pdf